# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## අත් උදව්කරු (නිවාස කටයුතු) [කාන්තා/පුරුෂ]

**කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලයේ පහසුකම් කළමනාකරණ අංශයේ අත් උදවුකරු (නිවාස කටයුතු) තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන/කාරිණියන් බඳවා ගැනේ.**

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

මෙම තනතුර දරන්නා අත් උදව්කරුවකු ලෙස චර්යානුගත සහ පූර්වාරක්ෂී නඩත්තු, ගොඩනැගීමේ කටයුතු, ක්‍රියාකරවීම් සහ බිඳ හෙලීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී පුහුණු කාර්මික ශිල්පීන්ට අවශ්‍ය සහාය ලබා දිය යුතු වේ. නේවාසික කටයුතු කළමනාකරණ වැඩ නායකයා විසින් දෛනික හෝ හදිසි වැඩවලදී තාක්ෂණ ශිල්පීන්ට අවශ්‍ය සහාය ලබා දීම සඳහා, තානාපති කාර්යාලයේ ශිල්ප ශාලිකාවේ හෝ තානාපති කාර්යාලයට අයත් නිවාස වලට අනියුක්ත කෙරේ. පුහුණු කාර්මික ශිල්පීන්ට අත් උදව් දීමට අමතරව තනතුර දරන්නා හට අමුද්‍රව්‍ය පාලනය, පින්තාරු කිරීම, නිම කිරීම, භාරකාර මට්ටමේ වැඩ කටයුතු, සාමාන්‍ය කම්කරු වැඩ, බිම් නඩත්තුව සහ උද්‍යාන පාලන කටයුතු වැනි කාර්යයන් ද පවරනු ලබයි.

**සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇ. ඩො. 337.25 කි.**
[කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මගින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2022 ඔක්තෝම්බර් 31 වනදා වන විට විනිමය අනුපාතය ඇ. ඩො. 1 = රු. 363.00 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.]

**සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:**

- **Colombo-2022-045;**

1. **අධ්‍යාපනය** - ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. *(අ.පො.ස. සාමාන්‍ය පෙළ සම්පූර්ණ කර තිබිය යුතු ය. ගණිත විෂය ඇතුළුව විෂයන් 6ක් සමත්ව තිබිය යුතු අතර අවම වශයෙන් විශිෂ්ට හෝ සම්මාන සමාර්ථ 3ක් සහිතව අ.පො.ස. සාමාන්‍ය පෙළ සම්පූර්ණ කර තිබිය යුතුය.)* ***(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.)***
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - පින්තාරු කිරීම්, නිම කිරීම්, භාරකාර වැඩ හෝ උද්‍යාන අලංකාරකරණය යන අංශයකින් අවම වශයෙන් වසර (2) පළපුරුද්ද තිබිය යුතු අතර ජලනල කාර්මිකයන්, වායු සමීකරණ කාර්මිකයන්, පෙදරේරුවන් වැනි පුහුණු ශිල්පීන්ගේ අත් උදව්කරුවෙකු වශයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතුය. ***(අදාළ සේවා සහතික පිටපත් අමුණා එවිය යුතු ය.)***
3. **භාෂා ප්‍රවීණතාවය** - II වන මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. ***(මෙය පරීක්ෂා කරනු ලැබේ).***
   එසේම IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
4. **නිපුණතා සහ හැකියාවන්** - මනා රිය ධාවන වාර්තාවක් සහිතව "B" පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් C,C1 කාණ්ඩ) තිබිය යුතු වේ. ***(රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතු ය.) (මෙය පරීක්ෂා කළ හැක.)***

**හෝ**

- **Colombo-2022-045S;**

1. **අධ්‍යාපනය** - මධ්‍යම මට්ටමේ විදුහල් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතු ය. *(ප්‍රාථමික අධ්‍යාපනය සහ අවම වශයෙන් වසර තුනක පූර්ණ කාලීන අධ්‍යාපනය ලබා තිබිය යුතුය.)* ***(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.)***
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - පින්තාරු කිරීම්, නිම කිරීම්, භාරකාර වැඩ හෝ උද්‍යාන අලංකාරකරණය යන අංශයකින් අවම වශයෙන් වසර (6) පළපුරුද්ද තිබිය යුතු අතර ජලනල කාර්මිකයන්, වායු සමීකරණ කාර්මිකයන්, පෙදරේරුවන් වැනි පුහුණු ශිල්පීන්ගේ අත් උදව්කරුවෙකු වශයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතුය. ***(අදාළ සේවා සහතික පිටපත් අමුණා එවිය යුතු ය.)***
3. **භාෂා ප්‍රවීණතාවය** - II වන මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. ***(මෙය පරීක්ෂා කරනු ලැබේ).***
   එසේම IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
4. **නිපුණතා සහ හැකියාවන්** - මනා රිය ධාවන වාර්තාවක් සහිතව "B" පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් C,C1 කාණ්ඩ) තිබිය යුතු වේ. ***(රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතු ය.) (මෙය පරීක්ෂා කළ හැක.)***

**අයදුම් කරන ආකාරය :**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. *ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.*

**අවශ්‍ය ලේඛන :**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)
- රියදුරු බලපත්‍රය

**තැපැල් හෝ ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත **2022 නොවැම්බර් 28** වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.